# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1873/4 – 2014 ජූලි 28 වැනි සඳුදා – 2014.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අගුළුගහ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/IMD/2013/627 හා 2013.10.10 දින දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'A' වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.5972 ක් පමණ වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – තෝරගොඩවිල – ප්‍රමාණය: හෙක්. 0.5972**
උතුරට: අගුළුගහ පන්ථාරාම විහාරස්ථානය හිමිකම් කියන පන්සල වත්ත; නැගෙනහිරට: අගුළුගහ පන්ථාරාම විහාරස්ථානය හිමිකම් කියන පන්සල වත්ත, අගුළුගහ මහ විද්‍යාලය හිමිකම් කියන හීනටිගල වත්ත සහ දොන් පියල් විතාන වසම් සහ ඩබ්. ජී. සිරිපාල හිමිකම් කියන හීනටිගල වත්ත; දකුණට: අගුළුගහ මහ විද්‍යාලය හිමිකම් කියන හීනටිගල වත්ත, දොන් පියල් විතාන වසම් සහ ඩබ්. ජී. සිරිපාල හිමිකම් කියන හීනටිගල වත්ත සහ පාර; බටහිරට: රත්නසිර බොරලැස්ස සහ තවත් අය හිමිකම් කියන තෝරගොඩවිල කුඹුර.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4-3/2/2013/HA/322.
2014 ජූනි මස 23 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 – 496


1A – G19964 – 10 (2014/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*